CORGI Registered Central Heating Engineer
Reliable, friendly. Any work not too small.
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2

## කන් දෙකේ අගේ

මානසික ලෙඩෙක් පරීක්ෂා කළ දොස්තර ඔහුගේ සිහිය හොඳදැයි බැලීමට ඔහුගෙන් ප්‍රශ්න කීපයක් ඇසී ය.

**දොස්තර:** මම ඔහේගෙ දකුණු කන කැපුවොත් මොකද වෙන්නෙ?
**ලෙඩා :** අනේ එතකොට මට ඇහෙන්නෙ නැතුව යාවි.....
**දොස්තර :** එතකොට මම වම් කන කැපුවොත් ....?
**ලෙඩා :** එතකොට මට පේන්නෙ නැතුව යාවි.....
**දොස්තර :** ඒක හරි කතාවක් නේ...කොහොමද එහෙම වෙන්නෙ?
**ලෙඩා :** ඇයි මහත්තෙයො එතකොට මගේ තොප්පිය පහතටම වැටේවි නේ ඇස් දෙකම වැහෙන්න.....

ලිහිණියා LIHINIYA
ලන්ඩනයේ ජනප්‍රිය ශ්‍රීලංකා අවන්හල
වසර 10 ක අඛණ්ඩ සේවය
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ
Buffet Daily £5.00 Weekend £6.50
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප, පිට්ටු, රොටි කොත්තු, බුරියානි, ලම්ප්‍රයිස් හා පරාටා
උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.
Tel. 0208 450 9052 / 0208 208 2658
66 Cricklewood Broadway, London NW2 3EP

ZOOM VISION VIDEO
Broadcast quality wedding video
- Use of broadcast quality 3 chip digital camera by a qualified videographer.
- Editing with Avid Digital Non-linear system.
- Montage or music video of your choice.
- DVD and VHS copies of the edited master.
- Coverage of Eastern & Western weddings.
- We also cover birthday parties, social functions, other special occasions.

T- 020 8590 6034 Mob. 07859000421

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
TRICO
Shipping & Forwarding Ltd
555 White Hart Lane
London N17 7RP
Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com
නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## පැරණි භාෂාව

අතීතයේ භාෂාව අද තරම් මොඩ් නොවීය. ඉල්ලුම් පත ට එදා කිව්වේ පෝර්මය කියාය. වෘත්තියට කිව්වේ රස්සාව කියාය. ලිපිනයට එදා කිව්වේ ලියුම් ලැබෙන පිළිවෙල කියාය.

Danger කියන ඉංග්‍රීසි වචනය අද හඳුන්වන්නේ **අනතුර** කියායි. එදා අතීතයේ එය හැඳින්වූයේ **ආන්ත්‍රාවයි** කියලයි. ඒ කාලයේ ලයිට් කණුවල මේ විදියේ මරු අවවාදයක් ලියා තිබුණේය.

**“ ආන්ත්‍රාවයි. අත නොතබනු. අත තැබූ විගස මැරී වැටෙයි. තවද ඔහුට නඩු පවරා උසාවියෙන් අච්චු කරනවා ඇත.”**

ඒ කියන්නේ ඒ මැරිච්ච තැනැත්තාටත් හිරේ යන්නට වන්නේය. ඔහු එල්ලුම් ගහට නියම වුනොත් ඒ මැරෙන්නේ දෙවැනි වතාවට ය.

## ජීවිත කාලය දීර්ඝකිරීම

*එය ධනවතුන් ප්‍රතිකාරගන්නා නර්සිං හෝම් එකකි. එය අයිතිකාර ප්‍රධාන දොස්තර එදින ලෙඩුන් පරීක්ෂාකරමින් සිටියේය. බොහෝ වෙලාවක් ඉතා සැලකිල්ලෙන් එක් ලෙඩෙකු පරීක්ෂා කළ දොස්තර අවසානයේ ඔහුට මෙසේ කීවේය.*

**දොස්තර:** මට ඔහේට නරක ආරංචියක් දෙන්න වෙනවා....
**ලෙඩා:** ඒ මොකක්ද ඩොක්ටර්....?
**දොස්තර:** ඔහේට තව ජීවත්වෙන්න තියෙන්නෙ මාස හයයි.....

*එය ඇසූ ලෙඩාගේ මුහුණ නරක් විය.*

**ලෙඩා :** හරි භයානකයි ඩොක්ටර්..... ඒ එක්කම කියන්න ඕන මට බිල ගෙවන්න සල්ලි නෑ....
**දොස්තර :** හරි එහෙනම් මම ඔහේට තව අවුරුද්දක් දෙන්නම් ජීවත්වෙන්න....

## ගමට කොපමණ දුරද?

“ මම ඇවිදගෙන ගියොත් කොච්චර වෙලාවකින් මට කාර්ගන් කියන ගමට යන්න ඇහැක් වෙයිද...? ”

ඉංග්‍රීසි සංචාරකයා අයර්ලන්තයේ බෙල්පාස්ට් නගර සීමාවේදී අයිරිෂ් ජාතිකයෙකුගෙන් ඇසුවේ ය.

“ මං දන්නෙ නෑ.....” අයිරිෂ්කාරයා ඕනවට එපාවට උත්තර දුන්නේය.

*සුද්දා කේන්තියෙන් පුපුරමින් මොනවා-දෝ අවලාද මුමුණමින් වේගයෙන් අඩිය තබමින් යන්නට ගියේ ය.*

“ හලෝ... හලෝ....ඔහොම ඉන්නවා...” අයිරිෂ්කාරයා නැවත සුද්දා දෙසට හැරී අඬගැසී ය.

“ මොකද....? ” ඉංග්‍රීසි ජාතිකයා නැවතී පිළිවිසී ය.

“ විනාඩි දහයකින් යන්න පුළුවන්....”

“ එහෙනම් කලින් කිව්වෙ තමුසෙ දන්නෙ නැහැයි කියලා....”

“ මම ඒ වෙලාවෙ දැක්කෙ නැනේ ඔහේ ඇවිදින වේගෙ....” අයිරිෂ්කාරයා කීය.

## රෝගෙක හැටි !

**ලෙඩා:** අනේ ! දොස්තර මහත්තෙයො දැන් කාලයක් තිස්සෙ මගේ අත් දෙක හරියට වෙව්ලනවා.....
**දොස්තර:** එහෙනම් ඔහේ හුඟක් බොනවා ඇති නේද.....?
**ලෙඩා:** නෑ...... කොහේ බොන්නද....? අත වෙව්ලන කොට බාගෙකට වැඩිය බිම ඉහිරෙනව නේ...

## සල්ලි මොකටද දන්නෙ නෑ

**පෙරේරා :** අපේ වයිප්ගෙ කටේ තියෙන් නෙම සල්ලි..... සල්ලි.....සල්ලි.... උණකාරය වතුර ඉල්ලනව වගේ කොච්චරවත් ඉල්ලන්නෙ සල්ලිමයි...
**සිල්වා :** ඉතින් ඔච්චර සල්ලි මොකටද එයාට.....? මොනවට වියදම් කරන්නද .....?
**පෙරේරා:** අනේ දන්නෙ නෑ මොනවටද කියලා..... මොකද මම කවදාවත් එයාට සල්ලි දීලා නෑ නේ.....

Community Legal Service
ANTONS
SOLICITORS
Community Legal Service
For Quality Services
We offer a comprehensive range of Legal Services.

| Conveyancing | Immigration |
| --- | --- |
| ♦ Sale & Purchase | ♦ Asylum cases |
| ♦ Right to buy (Council House) | ♦ Asylum Application |
| ♦ Re-Mortgage | ♦ Judicial Reviews |
| ♦ Assignment of Lease | ♦ Extensions of Visas |
| ♦ New Lease | ♦ Marriage Applications |
| ♦ Licensing Applications | ♦ Work Permits |
| ♦ Contractual Disputes | ♦ Business Visas |

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*
*Contact -* Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0
Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7
Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7
ANTONS SOLICITORS
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403
*E-mail* : antons.solicitors@btopenworld.com

# Low hung trousers banned in America
# පහළට හැලෙන කලිසම් තහනම්!



A US town’s new police chief has banned low hung trousers that expose wearers’ bums.

Police Chief David Dicks, of Flint, Michigan, says his officers will arrest people who wear their pants too low.

“ This immoral self-expression goes beyond free speech,” he said in a statement.

“ It rises to the crime of indecent exposure.”

Some Flint residents are backing Police Chief Dicks, reports the Flint Journal newspaper.

“It’s overdue,” said Sam Berry, 73, of Flint. And Gwendolyn Allen, 72, agreed: “ It’s so disgusting... It’s disgraceful.”

But others disagree. Claude Carter, 49, said wearing pants low was a fad not a crime.

“I see young and old wearing their pants that way,” said Mr Carter. “ It doesn't annoy me.”

Greg Gibbs, a local attorney, says how people wear their clothing is a form of expression -- but warns that not all of those forms are protected by the constitution.

In Riviera Beach, Florida, the police issued Kenneth Smith - a suspected drug dealer - a ticket for "exposure of undergarments in public." One of the officers noticed that his blue and white boxers were visible about two inches below his waist - an obvious threat to society.

ඒවා හඳුන්වනු ලබන්නේ “ හැළෙන කලිසම්” යනුවෙනි. එය ඉනෙන් බොහෝ පහළට එල්ලෙමින් කොයි මොහොතේ හෝ ගැළවී වැටෙතැයි යන සැකය ඒ දුටු කෙනෙකුගේ සිතෙහි ක්ෂණිකව පහළ කරවන අන්දමේ කලිසමකි. එසේම එය ඇඳුමකට වඩා විගඩමක් ලෙස දිස්වේ. එහෙත් එය අද යුරෝපයේ සහ ඇමරිකාවේ තරුණ පෙළ අතර ජනප්‍රිය විලාසිතාවකි.

ඇමරිකාවේ සමහර ප්‍රාන්ත වල මෙම හැලෙන කළිසම ඇඳගෙන යාම නීති විරෝධී කර ඇත. මිචිගන් හි ප්ලින්ට් නම් පෙදෙස භාර ප්‍රධාන පොලිස් නිළධාරියා වන ඩේවිඩ් ඩික්ස් කියන්නේ එම හැළෙන කලිසම ඇඳ ගෙන යන ඕනෑම කෙනෙකු අත්අඩංගුවට ගන්නා ලෙස පොලිස් ඒකකයේ නිළධාරීන්ට තමා අණදී ඇති බවයි. එම කලිසම සදාචාර විරෝධී වන්නා සේම අවිනීත අභපසභ ප්‍රදර්ශනයක්ද වන බව ඔහු කියයි. **අවිනීත අභපසභ ප්‍රදර්ශනය** අයත් වන්නේ අපරාධ ගණයටය. එසේ නම් එය දඬුවම් කළ යුතු වරදක් වන්නේ ය.

ප්ලින්ට් හි සමහර වැඩිහිටි වැසියෝ පොලීසිය එවැනි නීතියක් ක්‍රියාවට නැගීම පසසති. ඔවුන් කියන්නේ ඒ නීතිය මීට බොහෝ කලින් ගෙනෙන්නට තිබුණු බවයි. “ හැලෙන කලිසම් මහ අප්‍රසන්නයි ඒ වගේම අශීලාචාරයි....” යනුවෙන් පවසති.

සමහරුන්ගේ මතය ඊට බොහෝ වෙනස්ය. ඔවුන් කියන්නේ පොලීසිය පමණ ඉක්මවා යමින් තරුණයින් කෙරෙහි දැඩි ලෙස ක්‍රියාකරන බවය. “ මම දැකලා තියෙනවා තරුණ අය විතරක් නෙවෙයි වැඩිහිටි අයත් ඔය කලිසම අඳිනවා. මට නම් කමක් නෑ.” ඒ හැළෙන කලිසමට පක්ෂ මතයකි.